# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2403/71 – 2024 සැප්තැම්බර් මස 28 වැනි සෙනසුරාදා – 2024.09.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2018/04.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

අංක 2394/36 දරන හා 2024.07.24 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත්කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 02, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, අංක 457 හි පිහිටි සමස්ත ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමය (දිල්කුෂා ද සිල්වා මිය වෙනුවෙන්) සහ අනෙක් පාර්ශ්වය වශයෙන් මොරටුව, කටුබැද්ද හි පිහිටි නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A/71/2018 දරන හා 2024.05.20 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A/71/2018 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2025.07.24 දින සිට අවසන් වන බවට පනතේ 20(2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 සැප්තැම්බර් මස 05 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 042770 – 18 (2024/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පළමුවන උපලේඛනය

**"අ" ආකෘති පත්‍රය**

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**

බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය,
බණ්ඩාරනායක මාවත,
කටුබැද්ද,
මොරටුව.
2024.08.07

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය.

2024.07.24 දිනැති අංක 2394/36 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දා වූ ද නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය සහ සමස්ත ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමය (දිල්කුෂා ද සිල්වා මිය වෙනුවෙන්) බැඳී සිටින්නා වූ ද 2024.05.20 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

අධ්‍යක්ෂ ජනරාල්,
නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය,
බණ්ඩාරනායක මාවත,
කටුබැද්ද,
මොරටුව.

පිටපත : සමස්ත ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමය (දිල්කුෂා ද සිල්වා මිය වෙනුවෙන්). (අනෙක් පාර්ශ්වය)

(1) ප්‍රතික්ෂේප කරන පාර්ශ්වය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශ්වයකටම, වෘත්තීය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුටම වෙන වෙනම දැන්වීම් යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) හා 20(1) වන වගන්තිය බලන්න).

(2) දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශ්වයක්, සේවා යෝජකයෙකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශ්වයක්, සේවායෝජකයකු වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් ද යන වග ද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුර ද නිශ්චිතව සඳහන් කළ යුතුය.

EOG 09 - 0206

මගේ අංකය: IR/COM/03/2021/79.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

අංක 2391/34 දරන 2024.07.05 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත්කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් බත්තරමුල්ල, වික්‍රමසිංහපුර, අංක 4/බී/98 හි පදිංචි එම්.කේ.ඒ. රංගන රත්නායක මහතා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, අංක 75, 12 වැනි මහල, ප්‍රධාන කාර්යාලයෙහි පිහිටි මහජන බැංකුව අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A/33/2023 දරන හා 2024.05.07 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් මහජන බැංකුව වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A/33/2023 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2025.07.05 දින සිට අවසන් වන බවට පනතේ 20(2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 අගෝස්තු මස 22 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

පළමුවන උපලේඛනය

**"අ" ආකෘති පත්‍රය**

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**

බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම

මහජන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
12 වැනි මහළ,
අංක 75,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.
2024.08.01

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය.

2024.07.05 දිනැති අංක 2391/34 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දාවූ ද එම්. කේ. ඒ. ආර්. රත්නායක මහතා සහ මහජන බැංකුව බැඳී සිටින්නා වූ ද 2024.05.07 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

**ඩී. එම්. එම්. දිසානායක,**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි,
(මානව සම්පත්)

පිටපත : එම්. කේ. ඒ. රංගන රත්නායක මහතා, අංක 4/බී/98, වික්‍රමසිංහපුර, බත්තරමුල්ල.

EOG 09 - 0207

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.